# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2016

2022 නොවැම්බර් - 2023 ජනවාරි

**මානවශාස්ත්‍ර පීඨය**

**නාට්‍ය හා රංගකලාව** (නව/පැරණි නිර්දේශය)

**නාට්‍ය නිර්මාණය සහ විචාරය DMAT – E 3025**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

01. නාට්‍යයක් නිර්මාණය වීමේ ක්‍රියාවලියේ පූර්ව නිෂ්පාදන අවදිය, නිෂ්පාදන අවදිය, පසු නිෂ්පාදන අවදිය යන කාලත්‍රයේ කාර්යභාරය නිදසුන් සහිතව පහදන්න.

02. එකම පිටපතක් උපයෝගී කරගත්තද අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකුගේ අර්ථ කථනය හාත්පසින්ම වෙනස් වූ ප්‍රතිඵලයක් ගෙන එයි. නිදසුන් සහිතව විස්තර කරන්න.

03. රූපණය යන්න අර්ථකථනය කොට ස්ටැනිස් ලව්ස්කි ගේ න්‍යායාත්මක රූපණය **(Method Acting)** සහ බර්ටෝල් බ්‍රෙෂ්ට් ගේ එපික් **(Epic)** රංගය අතර වෙනස්කම් විග්‍රහ කරන්න.

04. රංගාලෝකය සඳහා භාවිතාකරන පහන් වර්ග හා ඒවායේ කාර්යභාරය විස්තරකොට නාට්‍යයක ගැඹුරු අර්ථකථනයක් සඳහා ඒවා භාවිතා කරන ආකාරය නිදසුන් සහිතව පහදන්න.

05. නාට්‍ය නිර්මාණයක වින්දනාත්මක සහ කලාත්මක ප්‍රකාශනය මතු කිරීමෙහිලා අධ්‍යක්ෂවරයා ගේ කාර්යභාරය කෙබඳදැයි නිදසුන් සහිතව විස්තර කරන්න.

06. සෞන්දර්යාත්මක ආකල්ප, සෞන්දර්යාත්මක නොවන ආකල්ප සහ කලාත්මක තෘප්තිය යනු කුමක්දැයි නිදර්ශනාත්මකව විස්තර කරන්න.

07. ඔබ මෑතකදී නැරඹූ නාට්‍යයක් නිදසුන් කොටගෙන එහි රංගාලෝකය, පසුතල නිර්මාණය සහ වේෂ නිරූපණය පිළිබඳ විචාරාත්මක විග්‍රහයක් කරන්න.

08. නාට්‍යයක සංගීතය සහ රංග වින්‍යාසය සිදු කල යුත්තේ අවස්ථාවන් උද්දීපනයට ද? අවස්ථාවන් අර්ථකථනය කිරීමට ද? නිදර්ශන සහිතව උක්ත අදහස විග්‍රහ කරන්න.

09. "නළුවරණය **(Casting)** නාට්‍යයක් නිෂ්පාදනයේ දී අධ්‍යක්ෂවරයා මුහුණ දෙන සංකීර්ණ අභියෝගයකි." විමසන්න.

10. ඔබ මෑතකදී නැරඹූ නාට්‍ය දෙකක් තෝරාගෙන එහි අර්ථකථනය, රූපණය සහ අනුෂංගික අංග භාවිතයේ තිබූ වෙනස්කම් පිළිබඳ පුවත්පතක පළකිරීමට සුදුසු විචාරයක් ලියන්න.

*********************************